සැ.යු.- 93.05.21 වැනි දින අංක 768 දරන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ : (II අ) වැනි ඡේදය හා IV(අ) වැනි කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 769 - 1993 මැයි 28 වැනි සිකුරාදා - 1993.05.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | – | තනතුරු – ඇබෑර්තු ... ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | – |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | – | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... | 712 | බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | – | තොටුපළ, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | – |
| | | විවිධ දැන්වීම් ... ... | – |



සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව– එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1993 ජූනි මස 03 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1993 මැයි මස 21 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1993 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

711—B 076379—8,375 (93/05)
F 1-

GP 2282



# පළාත් සභා නිවේදන

මගේ අංකය : මපස/ඒ/12/90/(xviii).

මධ්‍යම පළාත් සභාව

මතු දැක්වෙන ප්‍රඥප්තිය 1992 දෙසැම්බර් මස 22 වැනි දින පැවැති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ අතර, මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අංක ජීපීසී/එරස්/03/ හා 1993.03.08 වැනි දින දරන ලිපියෙන් එයට අනුමැතිය ලැබී ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1993 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 92,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

## මධ්‍යම පළාත

## මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ 8 වැනි ඡේදය අනුව පළාත ඇතුළත ක්‍රියාත්මක වන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.*

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය 1992 අංක 04 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා මෙහි මින්මතු " අධ්‍යක්ෂවරයා " යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රවාහන කටයුතු පිළිබඳ පළාත් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තියේ මූලධර්ම හා විධිවිධානවල සාමාන්‍ය පරිපාලනය ඔහුට භාර වන්නේ ය. තවද මෙම ප්‍රඥප්තියේ මූලධර්ම හා විධිවිධාන පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පළාත් ප්‍රවාහන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, පළාත් ප්‍රවාහන සහකාර අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැක.

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අධ්‍යක්ෂවරයාගේ විධිවිධාන යටතේ යම් පළාත් නියෝජ්‍ය ප්‍රවාහන අධ්‍යක්ෂවරයෙකු යම් පළාත් සහකාර ප්‍රවාහන අධ්‍යක්ෂවරයෙකු විසින් හෝ පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයෙකු විසින් කරනු ලැබිය හැකිය.

(3) ඇමතිවරයාගේ සාමාන්‍ය අධීක්ෂණය හා පාලනය යටතේ පළාත් අධ්‍යක්ෂවරයා හා (2) වැනි උප වගන්තිය යටතේ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු මෙම ප්‍රඥප්තියේ හා ඒ යටතේ පනවනු ලබන රෙගුලාසිවල මූලධර්ම හා විධිවිධාන ක්‍රියාත්මක කළයුතු වන්නේ ය.

මගී ප්‍රවාහන නිසිපත්‍ර සේවා සඳහා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය.

3. (1) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ හැර මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව හෝ කිසිම තැනැත්තෙකු විසින් මෙහි (2) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ මිස, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීම පිණිස පළාත තුළ මූලාරම්භ වන නිසිපත්‍ර සේවයේ යොදවනු ලබන බස්රථයක් ධාවනය නොකළ යුතුය.

(2) 1990 අංක 20 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලද්දාවූද, නැතහොත් එකී ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබුවාවූ ද, මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනට පූර්වාසන්නයෙහි වලංගුව ඇත්තා වූ ද, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ වෙන යම් ලියවිල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කලින් අවලංගු කරනු නොලැබුවහොත්, එහි සඳහන් වලංගු කාලය තුළ මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(3) කිසිම තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව වෙන් වෙන් ගාස්තු මත මාර්ගස්ථ මගී ප්‍රවාහන නිතිපතා සේවය සඳහා බස්රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) අධ්‍යක්ෂ විසින් හෝ දෙවන වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් පොලිස් නිලධාරියෙකු විසින් මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ වූ නියමයන්ගේ විධිවිධාන උල්ලංඝණය කරමින් මාර්ගස්ථ මගී ප්‍රවාහනය සඳහා යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් තහනමට ගැනීම කරනු ලැබිය හැකි අතර, එසේ තහනමට ගනු ලැබුයේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක බල සීමාවක් තුළ දී ද එම මහේස්ත්‍රාත් අධිකරණය වෙත අනිසි ප්‍රමාදයකින් තොරව ඒ වාහනය ඉදිරිපත් කිරීමට හෝ කරනු ලැබීමට විධිවිධාන යෙදිය යුතුය.

(5) යම් වාහනයක් (4) වැනි උප වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසාන වනතුරු ඒ වාහනය රඳවා තබා ගැනීමට හෝ අවස්ථානුකූලව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ වාහනය මුදා හැරීමට හෝ ආඥා කරනු ලැබිය හැකිය.

ආදායම් බලපත්‍රය හා අසීමිත රක්ෂණය ලබා ගැනීම.

4. (1) (මින් මතු " අවසර පත්‍රය " යනුවෙන් දැක්වෙන) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන නිතිපතා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ගැනීම උදෙසා බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් බස්රථ සඳහා වූ වලංගු ආදායම් බලපත්‍රයක් ලබා තිබිය යුතු වන්නේ ය.

(2) නිතිපතා මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ගැනීම උදෙසා බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් සිය නමින් එකී බස් රථය වෙනුවෙන් තෙවන පාර්ශව අවදානම්වලට වග කියන බවට වලංගු අසීමිත රක්ෂණ ආවරණයක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළයුතු වන්නේ ය.

බස් රථ වලින් අනුමත කරන ලද මගී ප්‍රවාහන සේවාව.

5 (1) මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් මගින් එහි අඩංගු කොන්දේසිවලට අනුකූලව ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ප්‍රවාහනය සඳහා නිතිපතා සේවයක් පවත්වාගෙන යාමට ඒ අවසර පත්‍රය දරන්නා ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක් යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නාට අයිතිවාසිකම් ලැබෙන්නේ ය.

(2) කිසියම් බස් රථයක් වෙනුවෙන් එහි ලියාපදිංචි අයිතිකරු නොවන තැනැත්තෙකුට මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

(3) (අ) කිසියම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහනය සඳහා නිතිපතා සේවයක් උදෙසා, එකම බස් රථයක් වෙනුවෙන් අවසර පත්‍ර එකකට වැඩි සංඛ්‍යාවක් ලබා නොගත යුතුය.

(ආ) කලින් ලබා ගන්නා ලද අවසර පත්‍රයක් මෙම ප්‍රඥප්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවකට (අ) ඡේදයේ විධිවිධාන අදාල නොවිය යුතුය.

(ඇ) (අ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු එමගින් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කළා වන්නේ ය.

මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ඉල්ලුම් කිරීම.

6 (1) අවසර පත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, එය අදාල වන බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් තම අත්සන යටතේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවෙක්ම (1) වැනි උප වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රයක් සමඟ පහත සඳහන් විස්තර ද සිය අත්සන යටතේ ඉදිරිපත් කළ යුතුය :–

(i) ඉල්ලුම් පත්‍රය අදාල වන බස් රථයේ ලියාපදිංචි අංකය, ආසන සංඛ්‍යාව හා අභ්‍යන්තර උස ප්‍රමාණය ,

(ii) වෙන් වෙන් ගාස්තු මත මගී ප්‍රවාහන සේවාව සඳහා ඉල්ලුම්පත්‍රයට අදාල බස්රථය යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගයේ ආරම්භක ස්ථානය, අතර මග වැදගත් නැවතුම් පලවුල්, ගමනාන්තය, මාර්ග අංකය හා මාර්ගයේ දුර ප්‍රමාණය (දළ වශයෙන් ) සහ

(iii) මෙහි 7 වැනි වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය සඳහා අධ්‍යක්ෂවරයා ඉල්ලා සිටින වෙනත් විස්තර.

අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් හිදුස්යක් කිරීම.

7 (1) මෙහි පහත (2) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම, අළුත් කිරීම, මාරු කිරීම හෝ එවැනි අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම, අලුත් කිරීම, හෝ මාරු කිරීම ප්‍රතික්ෂේප කිරීම පිණිස සම්පූර්ණ බලය සහ අභිමතය අධ්‍යක්ෂවරයාට තිබිය යුතුය.

(2) (මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම, මාරු කිරීම හෝ එවැනි අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම, මාරු කිරීම හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනත් දෙයක් කිරීම සම්බන්ධයෙන් ද) අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලබන්නාවූ හෝ මාරු කරනු ලබන්නා වූ යම් මාර්ගයක් හෝ මාර්ගයක් වෙන් කරදීම සම්බන්ධයෙන් ද තම අභිමතය ක්‍රියාත්මක

කිරීමේදී අධ්‍යක්‍ෂවරයා විසින් වෙන් වෙන් ගාස්තු සඳහා මගී ප්‍රවාහන පහසුකම් අවශ්‍ය වන සහ පහසුකම් සලස්වන තැනැත්තන්ගේ යහපත ද ඇතුලුව පොදුවේ මහ ජනතාවගේ යහපත පිළිබඳ මූලික වශයෙන් සැළකිලිමත් විය යුතු අතර, සිය අභිමතය පාවිච්චි කිරීමේ දී පහත දක්වෙන කාරණා පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්විය යුතුවේ.

(i) යෝජිත මගී ප්‍රවාහනය මහජන යහපත උදෙසා කොතෙක් දුරට අවශ්‍ය හා යෝග්‍යද යන වග.
(ii) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාවය.
(iii) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ එවැනි කිසියම් මාර්ගයක මගී ප්‍රවාහන සේවා දනටමත් කෙතරම් ප්‍රමාණවත් ලෙස සැලසී තිබේද යන වග.
(iv) (ප්‍රමාණවත්, යෝග්‍ය හා කාර්යක්‍ෂම සේවාවක් සැපයීමද ඇතුලුව) රථ වාහන ගමනා ගමනයට අදාලව ප්‍රදේශය සමස්ථයක් වශයෙන් ගත් කල එහි අවශ්‍යතා සහ දුම්රියෙන් මගී ප්‍රවාහනය ද ඇතුලු සියලුම මගී ප්‍රවාහන ක්‍රම සම්බන්ධීකරණය කිරීම.
(v) යම් ප්‍රදේශයකට හෝ යම් මාර්ගයකට අදළ මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සාධාරණ ගාස්තුවකට සපුරා ගත හැකි සතුටුදායක හා කාර්යක්‍ෂම ප්‍රවාහන පහසුකම් (දුම්රියෙන් සැළසෙන පහසුකම් ද ඇතුළුව) පවතින්නේ යයි අධ්‍යක්‍ෂවරයාගේ මතය වන්නේ නම්, එම සේවාවන්ට තරගයක් ඇති වන පරිද්දෙන් එම ප්‍රදේශයම හෝ එම මාර්ගයම හෝ සඳහා මගී ප්‍රවාහනයට අවසර දෙමින් අවසර පත්‍රයක් නිකුත් කිරීමට අහිතකරය යන බව.

*අවසර පත්‍ර වලංගු වන කාල සීමාව.*

(8) (1) නියම කරනු ලබන ගාස්තුව හෝ ගාස්තු තමා වෙත ගෙවනු ලබන්නේ නම් හා මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලබන හෝ පනවනු ලබන කොන්දේසි හා අවශ්‍යතා සපුරා ලන්නේ නම් මිස අධ්‍යක්‍ෂවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් කිසිම පුද්ගලයෙකුට නිකුත් නොකළ යුතුය.

(2) සෑම අවසර පත්‍රයක්ම –

(i) නියමිත ආකෘතිය අනුව විය යුතුය.
(ii) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරන ලද දින සිට මාස 12ක කාලයකට වලංගුව පවත්නේය.

*මගීන්ගේ යහපත හා අනෙකුත් අදළ කරුණු පිළිබඳව අවසර පත්‍රයේ අඩංගු කළයුතු කොන්දේසි.*

(9) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්‍ෂාව, යහපත හා පහසුව සැලසීම පිණිස අධ්‍යක්‍ෂවරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසි අඩංගු කරනු ලැබිය යුතුය.

ඒ කොන්දේසි අතර –

(i) මගීන්ගෙන් අය කරනු ලබන ගමන් ගාස්තු අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පතේ සඳහන් වූ පරිදි විය යුතුය ;
(ii) අවසර පත්‍රයේ අධිකාරය යටයේ යොද ගනු ලබන බස් රථය අවසර පත්‍රයේ සඳහන් වන මාර්ගයෙහි හෝ මාර්ග වල පමණක් මාර්ගස්ථ මගී ප්‍රවාහනය කළ යුතු බවට ;
(iii) (නියම කර ඇති විට) බස් රථය ධාවනය කාල සටහනෙහි සහ ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත් අවසර පත්‍රයේ බලය යටතේ යොද ගනු ලබන, බස් රථයේ රැගෙන යායුතු බවට හා ඒ තුළ ප්‍රදර්ශනය කළයුතු බවට ;
(iv) අවසර පත්‍රයේ බලය යටතේ යොද ගනු ලබන බස් රථය සියලු අවස්ථාවන්හිදී කාර්මික යෝග්‍යතාවයෙන් සහ මාර්ගයෙහි ධාවනයට හා මගී ප්‍රවාහන සේවාවට සුදුසු තත්ත්වයකින් පවත්වාගෙන යායුතු බවට ;
(v) අවසර පත්‍රයේ අධිකාර යටතේ යොද ගනු ලබන බස් රථයේ සේවය කරන කොන්දොස්තර හෝ කොන්දොස්තරගේ කාර්යය ඉටු කරන යම් තැනැත්තෙකු හෝ විසින්, සෑම මගියෙකුගෙන්ම අය කරනු ලබන බස් ගාස්තුව වෙනුවෙන් ඒ ගාස්තු ප්‍රමාණය සහ ඒ මගියාගේ ගමනේ ආරම්භක ස්ථානය හා ගමනාන්තය පැහැදිලිව සටහන් කරන ලද්දවූ ද එකී බස් රථයේ ලියාපදිංචි අංකය සහිත වූ ද ගමන් අවසර පත්‍රයක් එක් එක් මගියාට භාර දිය යුතු බවට ;
(vi) අවසර පත්‍රයෙන් අවසර දී ඇති මගීන් සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් එකී අවසර පත්‍රය යටතේ යොද ගනු ලබන බස් රථයෙන් කිසියම් අවස්ථාවක ප්‍රවාහනය නොකල යුතු බවට ;
(vii) අවසර පත්‍රයේ අධිකාරය යටතේ යොද ඇති බස් රථය ධාවනය කිරීමේදී කිසියම් අවස්ථාවක ගමනාන්තයට ළඟාවීමට පෙර බස් රථය ක්‍රියා විරහිතවීමෙන් හෝ එහි රියදුරුගේ හෝ කොන්දොස්තරගේ දෝෂයක් නිසා හෝ ගමනට බාධා වන්නේ නම් බස් රථයේ ගමන් ගන්නා මගීන්ට ගමනාන්තය තෙක් යෝග්‍ය පරිදි විකල්ප ගමන් පහසුකම් සලසා දිය යුතු බවට.

*අවසර පත්‍රය ලත් බස් රථය නිශ්චිතව හැඳින්වීම.*

10. අධ්‍යක්‍ෂවරයා විසින් අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී එකී සේවයේ යොද ගැනීම පිණිස බලය දෙනු ලබන බස් රථයේ හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍යයැයි අධ්‍යක්‍ෂවරයා සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන් එම බස් රථය නිශ්චිත වශයෙන් හඳුන්වා දිය යුතු වන්නේය.

*විධාන නිකුත් කිරීමට අධ්‍යක්‍ෂවරයාට ඇති බලය.*

11. අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන ඕනෑම තැනැත්තෙකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන පිළිපදින බවට වග බලා ගැනීම පිණිස අවශ්‍ය යැයි තමා අදහස් කරන විධාන අධ්‍යක්‍ෂවරයා විසින් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ විධාන ලැබූ තැනැත්තා විසින් ඒ විධානවල සඳහන් වන කාලය ඇතුළත ඒවා පිළිපැදිය යුතුය.

*අවසර පත්‍රයක් පැවරිය නොහැකි බව.*

12. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තෙකුට පවරනු ලැබිය නොහැකි අතර, එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේ ය.

*අවසර පත්‍ර දරන්නා විසින් විස්තරවල වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂට දන්විය යුතු බව.*

13. අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍ර දරන්නා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදුවූ දින සිට දින දාහතරක් ඇතුළත ඒ අවසර පත්‍ර දරන්නා විසින් ඒ වෙනස පිළිබඳව ලිඛිතව අධ්‍යක්ෂවරයාට දැනුම් දී ඒ පිළිබඳව අධ්‍යක්ෂකවරයා ගේ එකඟත්වය ලිඛිතව ලබා ගත යුතුය.

*මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් අලුත් කිරීම.*

14. අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එය අලුත් කිරීම සඳහා අධ්‍යක්ෂකවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී, ඒ අවසර පත්‍ර දරන්නා –

(i) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියා කර ඇති බවටත් ;

(ii) මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදකට වරදකරු වී නොමැති බවටත් ; සහ

(iii) එම අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන බවට හා අනෙකුත් අවශ්‍යතා සපුරාලන බවටත්

අධ්‍යක්ෂකවරයා සෑහීමකට පත්වන්නේ නම් ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට ඉදිරියට එක් අවුරුද්දක් හෝ ඊට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අලුත් කරනු ලැබිය හැකිය.

*අවසර පත්‍රයක් අවලංගු කිරීම.*

15. අවසර පත්‍රයක් දරන්නෙකු –

(i) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇති බවට ;

(ii) II වැනි වගන්තිය යටතේ අවසර පත්‍ර දරන්නාට නිකුත් කර ඇති යම් විධානයක් පිළිපැද නොමැති බවට ; හෝ

(iii) මේ ප්‍රඥප්තිය යටතේ යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක ඔහු දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට

අධ්‍යක්ෂකවරයා සෑහීමකට පත්වුවහොත් අධ්‍යක්ෂකවරයා විසින් ඒ අවසර පත්‍රය සම්බන්ධයෙන් නියමිත අවසර පත්‍ර ගාස්තුව මෙන් තුන් ගුණයකට නොවැඩි අධිභාරයක් පැනවීමේ නියෝගයක් හෝ අවසර පත්‍රය තුන් මසකට නොවැඩි කාල සීමාවකට අත්හිටුවීමේ නියෝගයක් හෝ අවසර පත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් හෝ පැනවිය හැකිය.

*අධ්‍යක්ෂකවරයාගේ තීරණයට හේතු අවසර පත්‍ර ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු බව.*

16. (1) අධ්‍යක්ෂකවරයා විසින් අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් සම්බන්ධයෙන් 15 වැනි වගන්තිය යටතේ නියෝගයක් කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක අධ්‍යක්ෂකවරයා විසින් තම තීරණය සහ එයට හේතු අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍ර ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍ර දරන්නාට දැනුම් දිය යුතුය.

(2) අධ්‍යක්ෂකවරයා විසින් 15 වැනි වගන්තිය යටතේ කරනු ලබන අවසර පත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝගයක් හෝ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගනු ලබන තීරණයක් පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, එම නියෝගය හෝ තීරණය කරනු ලැබූ දිනය ද ඇතුළුව එදින සිට දින තිහක් ඉක්මවූ දින පටන් ක්‍රියාත්මක විය යුතුය. මේ උප වගන්තියේ පරමාර්ථයන් සඳහා නියෝගය හෝ තීරණය ලියාපදිංචි තැපෑලෙන් යැවූ දිනය එම නියෝගය හෝ තීරණය කරනු ලැබූ දිනය ලෙස සැළකිය යුතුය.

*අභියාචනා.*

17. (1) (i) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ

(ii) අධිභාරයක්, අවසර පත්‍රය අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් නියෝග කරමින් ; හෝ

මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂකවරයා විසින් දැනුම් දෙනු ලබන තීරණයකින් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍රයක්, ඉල්ලුම්කරුවෙකු හෝ එවැනි අවසර පත්‍ර දරන්නෙකු විසින් තමාට එකී තීරණය නිකුත් කරනු ලැබූ දින සිට දින 7 ක් ඇතුළත එම තීරණයට විරුද්ධව ලිඛිතව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(2) මෙහි 1 වැනි උප වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් විසින් එම අභියාචනය තමා වෙත ලැබුන දින සිට දින හතක් ඇතුළත තම තීරණය අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍ර ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍ර දරන්නාට සහ අධ්‍යක්ෂට ද, ලිඛිතව දන්වා යැවිය යුතුවේ.

(3) මෙහි (2) වැනි උප වගන්තිය යටතේ ලේකම්වරයා විසින් දෙනු ලබන තීරණයකින් අතෘප්තියට පත් අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍ර ඉල්ලුම්කරුවෙකු හෝ අවසර පත්‍ර දරන්නෙකු විසින් එම තීරණයට විරුද්ධව තවත් එක් අභියාචනයක් එම තීරණයේ දින සිට දින 7ක් ඇතුළත ජාතික ගමනා ගමන කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් එම අභියාචන ලැබුණ දින සිට දින හතක් ඇතුළත එම අභියාචනය පිළිබඳ සිය තීරණය ලිඛිතව දිය යුතුවේ.

(4) (3) වැනි උප වගන්තිය යටතේ අභියාචනයක් ලැබුණු විට, ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් -

(අ) අභියාචනයට ඉඩ දෙමින්, අවස්ථාවෝචිත පරිදි අවසර පත්‍රය ප්‍රදානය කිරීමට හෝ අලුත් කිරීමට අධ්‍යක්ෂට විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනයට ඉඩ දෙමින් අධිකාරය, අවසර පත්‍රය, අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා වූ නියෝගය අවලංගු කිරීම ; හෝ

(ඇ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකිය.

(5) ඉහත (4) වැනි උප වගන්තිය සමග කියවිය යුතු (3) වැනි උප වගන්තිය යටතේ අභියාචනයක් සම්බන්ධයෙන් ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය නිශ්චිත අවසන් තීරණය වන්නේය.

(6) අභියාචනය සම්බන්ධයෙන් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ තීරණය පිළිබඳව පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ට හා අධ්‍යක්ෂට අප්‍රමාදව දැනුම් දියයුතු වන්නේය.

(7) 4 වැනි උප වගන්තිය යටතේ ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් තමාට දෙනු ලබන කිසියම් විධානයක් අධ්‍යක්ෂ විසින් ඉටු කරනු ලැබිය යුතුය.

18. (1) අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු මිසින් හෝ පොලිස් නිලධාරියකු විසින්, මේ ප්‍රඥප්තිය යටතේ වන අවසර පත්‍රයක අධිකාරය යටතේ මගී ප්‍රවාහනය කරමින් ධාවනය කරන බස් රථයකට අදාලව මෙම ප්‍රඥප්තියේ නියමිත විධිවිධාන කිසිවක් කඩකර ඇති ලෙස සොයා ගනු ලැබූ විටක දී ඒ කඩ කිරීම පිළිබඳව වගකීම පිළිගන්නා යම් තැනැත්තෙකු විසින්, එකී කඩ කිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීම වෙනුවට රුපියල් පන්සියයකට වැඩි නොවනසේ එකී කඩ කිරීම සොයා ගත් නිලධාරියා විසින් නියම කරනු ලබන ස්ථානීය දඩ මුදලක් ගෙවනු ලැබිය හැකිය. දඩ මුදල නියම කරන නිලධාරියා විසින් එකී නියමය ලිඛිතව භාරදෙනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව සුදුසු පරිදි ධාවන මාර්ගය හා බස්රථ අංකය ද සහිතව අධ්‍යක්ෂවරයාට දැන්විය යුතුවේ.

(2) එවැනි දඩ මුදලක් අධ්‍යක්ෂ වෙතට හෝ කිට්ටුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ පළාත් සභා ඒකාබද්ධ අරමුදලට බැර වනසේ ගෙවා එම ගෙවීමට සාක්ෂි වශයෙන් වරද සොයා ගත් දින සිට දෙසතියක් තුළ ලදුපත අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුවේ.

බලපත්‍රය බස් රථයේ ඉදිරිපස වාමුවා වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතු බව.

19. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එකී බලපත්‍රය නිකුත් කරනු ලැබූ බස් රථයේ ඉදිරිපස වාමුවා වීදුරුවේ පැහැදිලිව පෙනෙන අයුරින් ප්‍රදර්ශණය කළ යුතුය.

වාර වාර්තා ආදිය.

20. මේ ප්‍රඥප්තිය යටතේ තමාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ හා තම කාර්යයන් ඉටු කිරීමේ පරමාර්ථය සඳහා අධ්‍යක්ෂට අවශ්‍ය වන යම් වාර වාර්තාවක් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක්, ඒ සම්බන්ධයෙන් කෙරෙන දැනුම් දීමේ සඳහන් කාල සීමාවක් ඇතුළත සපයන ලෙස අවසර පත්‍රයක් ලබා සිටින්නෙකුට අධ්‍යක්ෂ විසින් ලිඛිත දැනුම් දීමක් කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ වගකීම වන්නේ ය.

21. (1) මගීන්ගේ යහපත සඳහා පළාත් සභා ප්‍රදේශය තුළ බස්ගාල් සහ නැවතුම් පොලවල් පිහිටුවීම, ඉවත් කිරීම, නවත්තු කිරීම, වැඩි දියුණු කිරීම, හෝ ඒවා පිහිටි තැන් වෙනස් කිරීම පළාත් පාලන ආයතන මගින් හෝ වෙනත් යෝග්‍යයයි සළකන අයුරකින් කරනු ලැබීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම හා නියෝග නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරයාට බලය පැවරෙන්නේය.

(2) බස්ගාලකින් හෝ බස් නැවතුම් පොලකින් බස්රථ ධාවනය සඳහා කාල සටහන් නියම කිරීම, සහ එම කාල සටහන් ක්‍රියාත්මක කිරීම කළමනාකරණය සඳහා යොදවනු ලබන කාර්ය මණ්ඩලයට අවශ්‍ය උපදෙස් හා නියමයන් නිකුත් කිරීම හා එම කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම හෝ ඒ සඳහා යෝග්‍ය විධිවිධාන යෙදීම සඳහා අධ්‍යක්ෂවරයාට බලය පැවරෙන්නේය.

(3) බස් ධාවනය සඳහා වන කාල සටහන් කළමනාකරණය සඳහා යොදවන ලද කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන්, අවස්ථාවෝචිතව පත් කිරීමේ හා සේවයෙන් පහ කිරීමද ඇතුලුව විනයානුකූලව පාලනය කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට පැවරෙන්නේය.

අමාත්‍යවරයාගේ නිර්දේශ ආදිය.

22. හුදෙක්ම මගී ප්‍රවාහන සේවාවේ උන්නතිය සළකා යෝග්‍ය අවස්ථාවන්හි දී පොදු රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව බස්රථ මිළදී ගැනීම සඳහා පහසුකම් සහ බදු සහන ලබාදීම සඳහා යෝජනා හා නිර්දේශ පළාත් සභාවේ අනුමැතිය සඳහා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

වරදවල් හා දඬුවම.

23. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ පනවන ලද නිකුත් කරන ලද හෝ දෙන ලද යම් නියෝගයක්, නියමයක්, විධානයක් හෝ අවශ්‍යතාවයක්, උල්ලංඝනය කරන හෝ ක්‍රියාත්මක නොකරන යම් තැනැත්තකු හෝ තමා දැනුවත්ම වහාජ හෝ සාවද්‍ය විස්තර ඇතුළත් යම් වාර වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කළා වන අතර, ඒ පිළිබඳව මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක සිර දඬුවමකට හෝ එකී දඩයට හා සිර දඬුවමට යන දෙකටම හෝ යටත් වන්නේය.

ප්‍රඥප්තිය යටතේ නියෝග සෑදීම.

24. (1) කිසියම් කරුණක් සම්බන්ධයෙන් නියමයන් පැනවිය යුතුයයි මෙම ප්‍රඥප්තියෙන් විධාන සැළසී ඇති දෑ වෙනුවෙන් කිසියම් කරුණක් සම්බන්ධයෙන් නියමයක් පැනවීමට, මේ ප්‍රඥප්තිය යටතේ අවසර දී ඇති දෑ වෙනුවෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හෝ ඒවායෙන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකිය.

(i) අවසර පත්‍ර ලබාගැනීම, අලුත්කිරීම, හෝ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය, භාවිත කළ යුතු ආකෘති හා ගෙවිය යුතු ගාස්තු ආදිය.

(ii) අවසර පත්‍රයක බලය යටතේ යොද ගනු ලබන බස්රථයක රැගෙන යායුතු පුවරු සහ සළකුණු.

(iii) අවසර පත්‍රයක බලය යටතේ යොද ගනු ලබන බස්රථයක රියදුරු හෝ කොන්දොස්තර විසින් රැගෙන යායුතු ලේඛන හා ඒවායේ ඇතුළත් කළයුතු විස්තර.

(iv) අවසර පත්‍රයක බලය යටතේ යොදගනු ලබන බස්රථයක් ප්‍රයෝජනයට ගන්නා යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්..

(v) අවසර පත්‍රයක බලය යටතේ යොද ගනු ලබන බස්රථවල ගමන්වාර සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා.

(vi) අවසර පත්‍ර දරන්නන් විසින් ඒ අවසර පත්‍රවල බලය යටතේ යොද ගනු ලබන බස්රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසන් කරන වේලාව සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබාගත යුතු වාර්තා.

(vii) මේ ප්‍රඥප්තිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම, යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධාරියා විසින් ඉල්ලා සිටින ලද විට ඒ වාර්තා එසේ පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කිරීම .

(viii) මගී ප්‍රවාහන සේවාව පිළිබඳ උනන්දුවක් ඇති, අවසර පත්‍ර දරන්නවුන්ගේ/ හෝ බස් මගීන්ගේ සංගම් සමිති, හා ඒකාබද්ධ මහා සංගම්වල කටයුතු පවත්වාගෙන යාමේ ක්‍රියාපටිපාටි සහ ඒවායේ කාර්යභාර ඉටු කිරීම පිළිබඳව ක්‍රියා පටිපාටිය.

(ix) බස් හිමියන්ගේ සහ අවසර පත්‍ර දරන්නවුන්ගේ සංගම් විමයීම.

(x) විශේෂයෙන්ම බස් ධාවන ඒකාබද්ධ කිරීම, වේලාවන් සංවිධානය කිරීම, වේලාවල් සටහන් කිරීම., සහ පහසුකම් තිබී පරිදි සහ සාධාරණ ලෙස සැළසීම සඳහා බස්ගාල් සහ බස් නැවතුම් පොලවල් සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම.

(xi) අවසර පත්‍රවල බලය යටතේ යොද ගනු ලබන බස්රථවල සේවයේ නියුක්ත කරනු ලබන රියදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ සුදුසුකම් නියම කිරීම සහ ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතා කලින් කල පරීක්ෂණයට භාජනය කරවීම.

(xii) පළාත් සභා ප්‍රදේශය තුළ හෝ ඒ තුළ කිසියම් මාර්ගයක මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාව අහිතකර මට්ටමට බිඳ වැටෙතැයි පෙනී යන හදිසි හා ආපද අවස්ථාවන්හි දී ගතයුතු ක්‍රියා මාර්ග.

(xiii) පළාත් සභා ප්‍රදේශය තුළ පවත්නා මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම හා කාර්යක්‍ෂමව කිරීම, නව සේවාවක් ආරම්භ කිරීම, බස් මගීන්ගෙන් හා අවසර පත්‍ර දරන්නවුන්ගෙන් අයකළ යුතු විවිධ ගාස්තු තීරණය කිරීම, අවසර පත්‍ර දරන්නවුන්ට මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යාමට උචිත, සාධාරණ, ආර්ථික ශක්‍යතාවයක් සැළසීමේ අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනිමින් ඒ ඒ මාර්ගවල ධාවනය විය යුතු බස් සංඛ්‍යාව පාලනය කිරීම ආදී ප්‍රධාන කොට ඇති විවිධ කරුණු සම්බන්ධයෙන් තමාට උපදෙස් හා නිර්දේශ ලබාදීම සඳහා අවශ්‍ය උපදේශක මණ්ඩල හෝ කමිටු පිහිටුවීම සහ ඒවායෙහි සාමාජිකයින් නම් කිරීම හෝ පත් කිරීම, කාර්ය භාරයන් සහ බලතල තීරණය කිරීම.

(xiv) අන්තර් පළාත් අවසර පත්‍ර නිකුත් කළයුතු අවස්ථාවන්හි දී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටි.

(3) මෙහි 2 වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේය.

(4) මෙහි (2) වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම එම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමෙන් පසු අනුමත නොකරන ලද යම් නියෝගයක් වේනොත් එය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොමැතිව අනුමත දින සිට එම නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් පවත්වන බව.

25. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(i) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේදී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුව සාමාන්‍යාධිකාරිවරයෙකුව හෝ ඊට සමාන වෙනත් නිලධාරියකුව සිටි සෑම තැනැත්තෙක්ම ; හෝ

(ii) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවෙකුව සිටි සෑම තැනැත්තෙකුම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අප සහායකත්වය නොමැතිව බව සහ ඒවකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

අවලංගු කිරීම.

26. (1) මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 20 දරන "මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය" ඒ යටතේ ගන්නා ලද කිසිදු ක්‍රියා මාර්ගයකට බලපෑමක් නොවන අයුරින් මෙයින් අවලංගු කරනු ලැබේ.

(2) (1) වැනි උප වගන්තියේ කෙසේ සඳහන් වුවද, 1990 අංක 20 දරන "මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය" යටතේ පනවන ලද නියමයන්, ඒවා අවලංගු කරනු ලබනතෙක් හෝ ඒවා වෙනුවට මෙම ප්‍රඥප්තිය යටතේ නියමයන් පනවනු ලබන තෙක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවන ලද නියමයන් ලෙස සලකනු ලැබිය යුත්තේය.

අර්ථ නිරූපණය.

27. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස - "පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඊට එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කොට , පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ද ඇතුළත් වේ.

"ද්විත්ව කාර්ය වාහනය" යන්නෙන් මගීන් හා භාණ්ඩ යන දෙකම ප්‍රවාහනය කිරීමට සැලසුම් කරන ලද වාහනයක් අදහස් කෙරේ.

"කුලී මෝටර් රථය" යන්නෙන් කුලී මෝටර් රථයක් ලෙස ලියාපදිංචි කරන ලද මෝටර් රථයක් අදහස්වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ, ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"බස්රථය" යන්නෙන් මෝටර් රථවාහන පනත යටතේ බස්රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහනයක් ද ඇතුළත් වේ.

"මගියා" යන්නෙන් කුලී මෝටර් රථයක හෝ බස් රථයක ප්‍රවාහනය කරනු ලබන තැනැත්තෙකු අදහස් වන අතර, ඊට රියදුරු සහ බස්රථයක් සම්බන්ධයෙන් වන කළ කොන්දොස්තර ඇතුළත් නොවේ.

"නියමිත" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගය මගින් නියමිත බව අදහස්වේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත අදහස්වේ.

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් සභාව අදහස් වේ.

"වෙන් වෙන් ගාස්තු" යන්නෙන් බස් රථයක මගියකු වශයෙන් යම් තැනැත්තෙකු ප්‍රවාහනය කරනු ලැබීම සඳහා කරනු ලබන ගෙවීමක් අදහස් වේ.

අනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

28. මේ ප්‍රඥප්තිය සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

05-279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.